## ස ම් පි ණ් ඩ න ය.

ලංකා සිවිල් සේවාවේ ඉතිහාසය වූ කලී මෙරට පැවති සම්ප්‍රදායගත මූලාදෑනි ක්‍රමය මත රෝපනය කළ මධ්‍යම හා ප්‍රාදේශීය පාලන ක්‍රමයේ ඉතිහාසයයි. කෝල්බෲක් කැමරන් කොමසාරිස් වරුන් රාජ්‍ය නිර්හාධවාදී සහ ලෙබරල්වාදී න්‍යාය ධර්මයන් ඇසුරෙන් මෙරට පාලන ක්‍රමය යලි සකස් කිරිමට ගත් උත්සාහය ද ඔවුන්ගේ යෝජනා ක්‍රියාවට නැංවූ ආකාරය ද ඉන් පැන නැගුණු ගැටලු හා ඒ විසඳීමට යෙදූ ප්‍රතිකර්මයන් ද පිළිබඳ විමසීමක් මෙම නිබන්ධනයෙන් ඉදිරිපත් කෙරේ. එහි පළමු පරිච්ඡේදයෙන් කෝල්බෲක් කැමරන් යෝජනා කවරේද, එම යෝජනාවන් කුමක් නිසා ඉදිරිපත් කළේ ද යන්න හා ඒ සම්බන්ධයෙන් ආණ්ඩුකාර වරුන් දැක්වූ අදහස් උදහස්ද යටත් විජිත ලේකම් වරයා ගත් තීරණයන්ද, ඒ තීරණයන් ක්‍රියාවට නැංවීමට ආණ්ඩුකාරවරයා ගත් පියවරද සාකච්ඡා කෙරේ. දෙවන පරිච්ඡේදයෙන් මධ්‍යම පාලන තන්ත්‍රයේ ස්වරූපය පිළිබඳව සාකච්ඡා කෙරේ. මෙහිදී ආණ්ඩුකාර වරයා, ව්‍යවස්ථාදායක හා විධායක සභා, විජිත ලේකම් කාර්යාලය, ඔඩිටර් ජෙනරාල් හා භාණ්ඩාගාරික, ශ්‍රේෂ්ඨාධිකරණය යන සංස්ථා හා සිලනල ඇතුලත් මධ්‍ය පාලන තන්ත්‍රය විස්තර වේ. තුන් වන පරිච්ඡේදයෙන් ප්‍රාදේශීය පාලන තන්ත්‍රයේ ස්වරූපය දැක්වේ. කච්චේරි ක්‍රමය යටතේ පාලාත් පාලනය ගෙන ගිය ආකාරයද, දිස්ත්‍රික් උසාවි ක්‍රමය ක්‍රියාවට නැගී ආකාරය හා දේශීය මූලා-දෑනි සංවිධානය ගැන ද මෙහිදී සාකච්ඡා කෙරේ. සිව්වන පරිච්ඡේදයෙන් ලංකාවේ පැවති සිවිල් සේවාවේ තත්වය පිළිබඳ විමසීමක් කෙරේ. සිවිල් සේවකයන්ගේ පත්වීම්, උසස්වීම්, වැටුප්, ස්වභාෂා ඉගෙනීම, අනාගත සුභ සිද්ධිය පිළිබඳ තුබූ බලාපොරොත්තු හා ඔවුන් වතු වගාවට සම්බන්ධවූ ආකාරය ගැන ද සාකච්ඡා කෙරේ. පස් වන හා අවසාන පරිච්ඡේදයෙන් කැම්බල් ස්ටැන්ලි ප්‍රතිසංස්කරණයන් පිළිබඳව සාකච්ඡා කෙරේ. ඉන් කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රියාත්මක වීමේදී ඇති වූ අඩු පාඩු සපුරාලීමට කැම්බල් ආණ්ඩුකාර තුමා හා යටත් විජිත ලේකම් ස්ටැන්ලි ස්වාමි වරයා ගත් උත්සාහය පිළිබඳ විමසීමක් කෙරේ.